ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அனுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி, 4ம்மாடி "ஆ" ஹரிச்சந்திரா மாவத்த, அனுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary

දුරකථනය / தொ.பே.இல / Tele : 025-2222695 | විමසීම් / விசாரணை / Inquiries : 025-2235790
Fax : 025-2224914 | E-mail csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No. : NCP/CS/ED/11/3-1
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2023.07.20

ආයතන චක්‍රලේඛ ලිපි 2022/02 (I)

උතුරු මැද පළාත්
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා,
දෙපාර්තමේන්තු ප්‍රධානින්.

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 අනුව වැටුප් රහිත දේශිය හා විදේශිය නිවාඩු ලබා ගැනිම.</u>**

රටෙහි පවතින මූල්‍ය දුෂ්කරතාවය මගහරවා ගැනිම සඳහා තාවකාලික පියවරක් වශයෙන් රාජ්‍ය සේවයේ මූලික වශයෙන් වෘත්තීමය නොවන තනතුරු වල සේවය කරන (කළමණාකරන සේවා නිලධාරි /සංවර්ධන නිලධාරි/ ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු) සේවකයින් ඉහත චක්‍රලේඛන විධිවිධාන යටතේ වැටුප් රහිත නිවාඩු ලබා දි විදේශ රැකියා සඳහා යොමු කිරිම හෝ දේශිය රැකියා හෝ ආර්ථික වශයෙන් ඵලදායි කාර්යක නිරතවීම සඳහා යොමු කිරිමට අපේක්ෂා කලද රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය සේවාවන්ට අයත් තනතුරු වන වෛද්‍ය, හෙද, පරිපූරක වෛද්‍ය හා ගුරු සේවය හා තාක්ෂණික සේවාවන්ට අයත් තනතුරුවල සේවය කරන නිලධාරින් වැඩි වශයෙන් ඉහත චක්‍රලේඛ විධිවිධාන යටතේ විදේශගත වීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත.

02. රජයේ සියලුම බඳවා ගැනිම මේ වන විට තාවකාලිකව අත්හිටුවා ඇති පසුබිමක ඉහත සඳහන් අත්‍යවශ්‍ය සේවාවන්ට අයත් තනතුරුවල සේවයේ නියුතු නිලධාරින් වැඩිවශයෙන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනිම පළාතේ සෞඛ්‍ය පද්ධතිය, පාසල් පද්ධතිය හා අනෙකුත් සංවර්ධන හා කෘෂිකාර්මික අංශයේ වෘත්තිමය කාර්යයන් සඳහා දැඩි ලෙස බලපෑමක් එල්ලවී ඇති බවට මා වෙත කරුණු වාර්ථා වී ඇත.

03. විශේෂයෙන් සෞඛ්‍ය සේවයේ මෙන්ම ගුරු සේවයේ ගණිතය,විද්‍යාව, ඉංග්‍රිසි හා තොරතුරු තාක්ෂණවේදය වැනි ප්‍රධාන විෂයන් වල මෙන්ම දෙමළ මාධ්‍ය පාසල්වල , දැඩි ලෙස ගුරු හිඟය පවතින දුෂ්කර ප්‍රදේශවල විවිධ පාසල්වල සේවයේ නියුතු ගුරුවරුන් මෙලෙස විදේශ නිවාඩු ලබාගැනිම හේතුවෙන් ආයතනවල මහජන සේවාවන් හා පාසල්වල අධ්‍යාපන කටයුතු නිසිපරිදි පවත්වාගෙන යාම අභියෝගයකට ලක්වී ඇති බවට මහජන පැමිණිලි ලැබෙමින් පවති.

04.රජය මඟින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 නිකුත් කරමින් අපේක්ෂා කරන ලද රජයේ වෘත්තිමය නොවන තනතුරු දරණ සේවකයින් වෙනුවට රජයේ ආයතන වල අත්‍යවශ්‍ය මහජන සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය තනතුරු වල සේවයේ නියුතු නිලධාරින් විදේශ ගතවුවහොත් එය පළාත් සභාවේ සේවාවන් පවත්වාගෙන යෑමට අහිතකර ලෙස බලපා හැකිය.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පුහුණු / பயிற்சி / Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planing | ඉංජිනේරු / பொறியியல் / Engineering | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|---|
| දුරකථනය / தொ.பே.இல Telephone | 025-2224915 | 025-2235041 | 025-2237430 | 025-2222238 | 025-2220910 | 025-2222736 |
| ෆැක්ස් / தொலைநகல் Fax | 025-2222736 | 025-2220950 | 025-2233400 | 025-2225295 | 025-2220910 | 025-2222736 |
| විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் E-mail | ncpmdtu@yahoo.com | ncpmdtu@yahoo.com | | | | |

05. එබැවින් මින් ඉදිරියට ඉහත චක්‍රලේඛන විධිවිධාන අනුව දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීමට ඉල්ලුම් කරන පහත සඳහන් සේවාවන්ට අයත් තනතුරු වල සේවයේ නියුතු නිලධාරීන්ගේ එවැනි ඉල්ලීම් නිර්දේශ කර මා වෙත එවීමට පෙර ඔවුන්ගේ මුළු නිවාඩු කාලය සඳහාම රාජකාරි ආවරණය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ඇති බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් පෞද්ගලිකව පරීක්ෂා කර ඒ බවට සහතිකයක් මා වෙත ඉදිරිපත් කල යුතුය. එලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සහතිකය නොමැතිව ඉදිරිපත් කරනු ලබන නිවාඩු ඉල්ලුම්පත්‍ර සඳහා අනුමැතිය නොදෙන බවට කාරුණිකව දැනුම් දෙමි.

I. පරිපූරක වෛද්‍ය සේවය
II. හෙද නිලධාරී සේවය
III. ගුරු සේවය
IV. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් තනතුරු

06. තව ද 2023.07.11 දින සිට දේශීය / විදේශීය නිවාඩු ඉල්ලුම් කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (III) අනුව නව ගිවිසුම පත්‍රය සම්පූර්ණ කර අදාළ නිවාඩු අයදුම් පත්‍ර යොමු කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

එල්.ජේ.එම්.ජී. චන්ද්‍රසිරි බණ්ඩාර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත